අංකය -

# මැතිවරණ කොමිෂන් සභාව
# ටෙන්ඩර් දැන්වීමයි

**මැතිවරණ කොමිෂන් සභාවේ භාවිතයෙන් පසු ඉවත් කරන ලද වාහන විකිණීම සඳහා මිළ ගණන් කැඳවීම.**

මැතිවරණ කොමිෂන් සභාවේ භාවිතයෙන් පසු ඉවත් කරන ලද පහත දැක්වෙන වාහන සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් කැඳවා විකිණීමට කටයුතු කරනු ලැබේ.

| වාහනයේ ලියාපදිංචි අංකය | වාහන වර්ගය සහ මාදිලිය | ආපසු නොගෙවන තැන්පත් මුදල රු. |
|---|---|---|
| KS - 0873 | BMW – 5281 (Car) | 50,000.00 |
| KF – 4105 | Suzuki – Liyana (Car) | 30,000.00 |
| KA – 7633 | Nissan – Sunny (Car) | 30,000.00 |
| GA- 9487 | Isuzu – TFS54S (Cab) | 25,000.00 |
| GA – 9491 | Isuzu – TFS54S (Cab) | 25,000.00 |
| 253 – 0443 | Toyota – Hilux (Cab) | 25,000.00 |
| 253 – 0447 | Toyota – Hilux (Cab) | 25,000.00 |

ඉහත සඳහන් ලියාපදිංචි අංක දරණ වාහන රාජගිරිය මැතිවරණ කොමිෂන් සභා පරිශ්‍රයේ ගාල්කර ඇති අතර, මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ අවසරය මත 2026.09.08 දින සිට 2026.09.28 දින දක්වා සතියේ දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා වාහන පරීක්ෂා කිරීමේ අවසර පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසු වාහන පරීක්ෂාකර බැලිය හැක.

2026.09.08 දින සිට 2026.09.28 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා, එක් එක් වාහනයක් සඳහා ආපසු නොගෙවනු ලබන රු.1000.00 ක ගාස්තුවක් රාජගිරිය මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ 2 වන මහලේ ගිණුම් අංශයේ සරප් වෙත ගෙවා ලබා ගන්නා පොදු 172 කුවිතාන්සිය රාජගිරිය මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ ප්‍රසම්පාදන අංශය වෙත ඉදිරිපත් කර, ටෙන්ඩර් පත්‍රිකා හා වාහන පරීක්ෂා කිරීමේ අවසර පත්‍රය ලබා ගත හැකිය.

එසේම, මිළ ගණන් සඳහන් කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර්පත් බහාලුමට දැමිය යුතු අතර, එම ටෙන්ඩර් පත්‍රිකා භාර ගන්නා අවසන් දිනය 2026.09.29 පෙ.ව.9.30 දක්වා පමණක් වේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම 2026.09.29 දින පෙ.ව.10.00ට මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ උතුරු පර්යන්තයේ පළමු මහලේ පිහිටි ශ්‍රවණාගාරයේදී සිදු කෙරේ. එම අවස්ථාවට, මිළ ගණන් ඉදිරිපත් කරන්නන් හෝ ටෙන්ඩර්කරුගේ විධිමත් ලෙස බලය පැවරූ නියෝජිතයෙකු සහභාගි විය යුතු ය.

දුරකථන අංක 0112868441 හෝ 0112868442අමතා, ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් හෝ ප්‍රසම්පාදන අංශයෙන් වැඩි විස්තර ලබා ගත හැක.

මැතිවරණ කොමසාරිස් ජනරාල්,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත
රාජගිරිය

දිනය: